ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අති විශෙෂ

අංක 1947/49 - 2016 ජනවාරි මස 01 වැනි සිකුරාදා - 2016.01.01

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

### රේගු නිවේදනය

රේගු ආඥාපනත (235 වන අධිකාරිය)

රේගු ආඥා පනතේ (235 වන අධිකාරිය) 103 ආ (1) වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව ගරු මුදල් අමාත්‍ය රවි කරුණානායක වන මා, මෙම බහාලුම් මුද්‍රා මෙරටදී වෙනස් නොවූ බවට දෙනු ලබන සහතිකය සඳහා වූ රෙගුලාසි රජයේ ගැසට් පත්‍රයේ පළ කළ දින සිට බල පැවැත්වෙන බවට මෙයින් නියෝග නිකුත් කරමි.

රවි කරුණානායක,
මුදල් අමාත්‍ය.

2016 ජනවාරි මස 01 දින,
කොළඹ,
මුදල් අමාත්‍යාංශයේ දී ය.

**විධිවිධාන**

මෙකී විධිවිධාන, ''බහාලුම් මුද්‍රා මෙරට දී වෙනස් නොවූ බවට දෙනු ලබන සහතික විධිවිධාන'' යනුවෙන් හැඳින්විය හැකි අතර, මෙකී විධිවිධාන ගැසට් පත්‍රයේ පළ කළ දින සිට බලපැවැත්වෙනු ඇත.

1. ''බහාලුම් මුද්‍රා මෙරට දී වෙනස් නොවූ නැව් භාණ්ඩ'' වෙනුවෙන්, නෞකා ප්‍රධානියා හෝ නෞකා ප්‍රධානියාගේ අනුමැතිය ලැබූ නැව් නියෝජිතවරයාගේ හෝ ඉල්ලීම මත, රේගු අධ්‍යක්ෂ ජනරාල්වරයා හට මෙකී ''බහාලුම් මුද්‍රා මෙරට දී වෙනස් නොවූ බවට දෙනු ලබන සහතිකය'' නිකුත් කිරීමේ බලය මෙයින් පැවරේ.

2. ''බහාලුම් මුද්‍රා මෙරට දී වෙනස් නොවූ නැව් භාණ්ඩ''
පහත සඳහන් සියළු අවශ්‍යතා සපුරාලන නැව් භාණ්ඩ තොග මෙකී විධිවිධාන යටතට ගැනෙන ''බහාලුම් මුද්‍රා මෙරට දී වෙනස් නොවූ නැව් භාණ්ඩ'' යනුවෙන් අදහස් කෙරේ :-

(අ) ශ්‍රී ලංකාවේ ගුවන් තොටුපළක් හෝ වරායක් ඔස්සේ වෙනත් රටක් වෙත යැවීමේ අරමුණින් ශ්‍රී ලංකාවේ මුහුදු සීමාවට ඔබ්බෙහි වූ ස්ථානයකින් බහාලුම්ගත කළ සහ ශ්‍රී ලංකාවේ දී නැවකින් නැවකට මාරු කරන ලද නැව් භාණ්ඩ තොගයක් විය යුතු ය.

(ආ) ශ්‍රී ලංකාවට ලඟාවූ බහාලුමේ, එය රැගෙන ආ නැව් සමාගම විසින් තබන ලද කඩතොළු ප්‍රතිරෝධී මුද්‍රාවක්, ශ්‍රී ලංකාවේ වරායකින් හෝ ගුවන් තොටුපළකින් එකී බහාලුම අවසන්වරට එකී නෞකාවට පටවන තුරු නොවෙනස්ව පැවතියේ නම් ;

(ඇ) ශ්‍රී ලංකාවට ලඟාවූ අවස්ථාවේ පටන් ශ්‍රී ලංකාවෙන් අවසන් වරට මුදාහැරීමට යළි පටවන තුරු, බහාලුම, ශ්‍රී ලංකා රේගුවේ අධීක්ෂණය සහ පාලනය යටතේ පැවතියේ නම් ;

(ඈ) බහාලුම ශ්‍රී ලංකාවේ පැවති කාලය පුරා එතුල පැවති ද්‍රව්‍ය කිසිදු වෙනස් කිරීමකට භාජනය නොවීමත් එකී ද්‍රව්‍ය එහි හොඳ තත්වයෙන් කාලයක් පවත්වා ගැනීම උදෙසා කරනු ලබන මෙහෙයුමක් විනා ඉන් පරිබාහිර කිසිදු මෙහෙයුමක් සිදු නොකළ එකක් විය යුත්තේ ය.


*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

3. ''බහාලුම් මුද්‍රා මෙරටදී වෙනස් නොවූ බවට දෙනු ලබන සහතිකය'' අවශ්‍ය කෙරෙන එකී නෞකාවේ නිල දේශීය නියෝජිතයා විසින් ඒ බව රේගු අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත දන්වා සිටිය යුතු අතර, ඒ අනුව ඔහු විසින් රේගු අධීක්ෂණ සේවා පහසුකම් සපයා දෙනු ඇත. ඉන් අනතුරුව, එම බහාලුම ශ්‍රී ලංකාවේ දී නැවකින් නැවකට මාරු කිරීමේ කටයුතු අවසන් කිරීමෙන් පසු ඉහත කී විධිවිධාන අංක (2) ප්‍රකාර අවශ්‍යතා සපුරා ඇතිවිට ශ්‍රී ලංකාව හරහා නැවකින් නැවකට මාරු කළ නැව් භාණ්ඩ වෙනුවෙන් ''බහාලුම් මුද්‍රා මෙරටදී වෙනස් නොවූ බවට දෙනු ලබන සහතිකය'' ලබාගැනීමට ඔහුට ඉල්ලීමක් කළ හැකිය.

4. ''බහාලුම් මුද්‍රා මෙරට දී වෙනස් නොවූ බවට දෙනු ලබන සහතිකය'' සඳහා අයදුම් කරනු ලබන එම නෞකාවේ නිල දේශීය නියෝජිතයා විසින් එකී බහාලුම/බහාලුම් ඉහත විධිවිධානයන්හි අංක (2) හි සඳහන් අවශ්‍යතා සපුරා ඇති බවටද එකී අයදුම් පත්‍රයේම සහතික කර තිබිය යුතු වේ.

5. අනතුරුව, ඉහත විධිවිධානයන්හි අංක (2) හි සඳහන් අවශ්‍යතා සපුරා ඇති බවට රේගු අධ්‍යක්ෂ ජනරාල්වරයා සෑහීමකට පත්වන්නේ නම්, මෙකී විධිවිධානයන්හි අංක (6) හි සඳහන් අදාළ ගාස්තුව අයකරගනිමින් මෙහි ඇමුණුමේ සඳහන් ආකෘතිය පුරවා ''බහාලුම් මුද්‍රා මෙරටදී වෙනස් නොවූ බවට දෙනු ලබන සහතිකයක්'' නිකුත් කළ හැකිය.

6. එලෙස නිකුත්කරනු ලබන එක් සහතිකයක් සඳහා රේගු අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් ආරම්භක වශයෙන් ඇ.එ.ජ. ඩොලර් 10/- ක් බැගින් අයකරනු ඇත. මෙම ගාස්තුව මුදල් ඇමතිවරයා සමග සාකච්ඡා කර වරින් වර ප්‍රතිශෝධනය කෙරෙනු ඇත.

ඇමුණුම

| | |
|---|---|
| 1. නැව් නියෝජිතයාගේ/නැව් භාණ්ඩ මෙහෙයුම්කරුගේ නම සහ ලිපිනය | ශ්‍රී ලංකා රේගුව ලිපිනය ː නො. 40, කෙලින් වීදිය, කොළඹ 11 - ශ්‍රී ලංකා<br>විද්‍යුත් තැපැල ː dgc@customs.gov.lk<br>ටෙලි- +941122470945-8<br>ෆැක්ස් ː +94112446364<br>**බහාලුම් මුද්‍රා මෙරට දී වෙනස් නොවූ බවට දෙනු ලබන සහතිකය**<br>නො. .................................................... අනුකූලව නිකුත් කරන ලදී. |
| | කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා පමණි.<br>(පහත විස්තර කර ඇති භාණ්ඩ ශ්‍රී ලකා රේගුව මගින් මුද්‍රා තබා ඇත්නම්, එම මුද්‍රා අංකය මෙහි සඳහන් කළ යුතු ය.) |
| 2. භාණ්ඩ තොගය පිළිබඳ විස්තර<br>(අ) භාණ්ඩ විස්තරය | |
| (ආ) භාණ්ඩවල නිපන් රට | (ඇ) නෞභාර පත්‍ර අංකය |
| (ඈ) ශ්‍රී ලංකාවට භාණ්ඩ ගොඩබාන ලද දිනය | (ඉ) ශ්‍රී ලංකාවෙන් පිටත් වූ දිනය |
| (ඊ) අවසන් ගමනාන්තය | (උ) මඟින් (යාත්‍රාවේ නම සහ මුහුදු ගමන් අංකය) |

3. නැව් නියෝජිත/නැව් භාණ්ඩ මෙහෙයුම්කරුගේ ප්‍රකාශය

මා/අප ප්‍රකාශ කර සිටින්නේ

(අ) ඉහත විස්තර කරන ලද භාණ්ඩ අවසන් ගමනාන්තය තෙක් කිසිදු වෙනස් කිරීමකට භාජනය නොවී ශ්‍රී ලංකාවේ දී නැවකින් නැවකට මාරු කර ඇති බවත් ; සහ

(ආ) ඉහත සපයා ඇති සියලු තොරතුරු සත්‍ය හා නිවැරැදි බවත් ය.

බලධාරියාගේ අත්සන ː
නම ː
තනතුර ː
දිනය ː

(සමාගම් මුද්‍රාව)

4. ශ්‍රී ලංකා රේගුව මගින් කරනු ලබන සහතික කිරීම

අපගේ දැනීමේ ප්‍රමාණයට අපනයනකරුගේ ප්‍රකාශය සත්‍ය හා නිවැරැදි බවට සහතික කරමු. පැන නැඟිය හැකි කවර හෝ තත්ත්වයක් යටතේ අප පාර්ශ්වය වෙත කවර හෝ අගතියක් හෝ වගකීමක් නොමැතිව මෙම සහතිකය නිකුත් කරන ලදී.

බලධාරියාගේ අත්සන ː
නම ː
තනතුර ː
දිනය ː

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.